{ සියලු හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලු හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்தி ணைக்கலாம் - வடமத்திய மாகானம்
Department of Education – North Central Province

| 13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පැය 02 |
|---|---|---|

**52 S I**

## නර්තනය (දේශීය) - I කොටස

පාසලේ නම :- .........................................................

විභාග අංකය :- .........................................................

**උපදෙස් :**

- **ප්‍රශ්න සියල්ලටම මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයිය යුතුයි.**
- **එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.**
- **ප්‍රශ්න අංක 1 - 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුරු තෝරා ඊට අංකය ඉදිරියෙහි ඇති වරහන තුළ යොදන්න.**
- **ප්‍රශ්න අංක 26 - 50 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී අදාළ පිළිතුර තිත් ඉරි මත ලියන්න.**

01. හස්ත හා පාද චලන හුරු කිරීම සඳහා දේශීය නර්තන සාම්ප්‍රදායන් හි භාවිත සරඹ අභ්‍යාස වනුයේ,

i. අත් සරඹ, මණ්ඩි පද ,ඉලංගම් සරඹ
ii. පා සරඹ, ඉලංගම් සරඹ, දොඹින පද
iii. ගොඩ සරඹ, ඉලංගම් සරඹ, මණ්ඩි පද
iv. ඉලංගම් සරඹ, මණ්ඩි පද, ගොඩ සරඹ
v. ගොඩ සරඹ, ඉලංගම් සරඹ, දොඹින පද (...........)

02. "සිංහල සැරසිලි කලාව" "පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය" "බලියාග පිළිවෙල " යන කෘතීන් පිළිවෙලින් රචනා කරන . ලද්දේ,

i. තිස්ස කාරියවසම්, ලයනල් බෙන්තරගේ, ජයසේන කෝට්ටේගොඩ
ii. ලයනල් බෙන්තරගේ, ජයසේන කෝට්ටේගොඩ, තිස්ස කාරියවසම්
iii. මුදියන්සේ දිසානායක, ලයනල් බෙන්තරගේ, ධම්මිකා ලංකාතිලක
iv. ශ්‍රියානි රාජපක්ෂ, ජයසේන කෝට්ටේගොඩ, ලයනල් බෙන්තරගේ,
v. ලයනල් බෙන්තරගේ, ජයසේන කෝට්ටේගොඩ, ශ්‍රියානි රාජපක්ෂ (...........)

03. මංගලම් නර්තනය සඳහා වාදනය කරනු ලබන අලංකාර බෙරපදයක් වන්නේ,

i. දොංතකු දොංතකු දොංජිං ගත් තත් ජිං තරිකිට
ii. දොංතකු දොං ජිං තක තරිකිට ජිං තරිකිට ජිංතක තරිකිට
iii. දොංතකු දොං ජිං තත් ජිං තත් ජිං තරිකිට
iv. දොංතකු දොංතකු දොංතකු ජිං ජිං ගත් තත් රුද කුද කඩතක
v. දොද් දොද් දොං ජිං ජිං තත් තත් ජිං තත් තත් ජිං ජිං තත් ජිං (...........)

04. අනුපිළිවෙලින් වීර, අද්භූත, ශාන්ත යන රසයන්ගෙන් උපදින භාවයන් වන්නේ,

i. උත්සාහය, විශ්මය, ශාන්ත
ii. රෞද්‍ර, ශෘංගාර,
iii. උත්සාහය, විශ්මය, කරුණා
iv. ශාන්ත, විශ්මය, උත්සාහය
v. ශෘංගාර, ශාන්ත, රෞද්‍ර (...........)

05. රස භාව පිළිබඳ අදහස් දැක් වූ  පෙරදිග මතවාදීන් දෙදෙනකු වන්නේ,

i. භරතමුණි, ඇරිස්ටෝටල්
ii. භරතමුණි, නන්දිකේෂ්වර
iii. නන්දිකේෂ්වර, ප්ලේටෝ
iv. ඇරිස්ටෝටල්, ප්ලේටෝ
v. නන්දිකේෂ්වර, සොක්‍රටීස් (...........)

06. මහනුවර දළදා මාලිගාවේ දළදා පෙරහර මංගල්‍යය අවසානයේ විෂ්ණු දේවාලය හා සම්බන්ධව පවත්වනු ලබන ශාන්ති කර්මය වෙනුයේ,

i. පහතරට වලියක් මංගල්‍ය ශාන්තිකර්මය
ii. සබරගමු කුමාර සමයම ශාන්තිකර්මය
iii. උඩරට කඩවර කංකාරි ශාන්තිකර්මය
iv. පහතරට සූනියම් ශාන්තිකර්මය
v. උඩරට වලියක් මංගල්‍යය ශාන්තිකර්මය (...........)

07. "සි යොපත් පතිනේ - දිගුණුව නොතිනේ " මෙම කවිය

i. ග්‍රහ පංති කවි වලදී ගායනා කරයි
ii. කොහොඹා හැල්ලේදි ගායනා කරයි
iii. මඩුපුරයේදී ගායනා කරයි
iv. කිරිමඩුවේදී ගායනා කරයි
v. නානුමුරියේදී ගායනා කරයි (...........)

08. මුල් මාත්‍රය හා ශුද්ධ මාත්‍රය යන නර්තන අංග අයත් වනුයේ,

i. පහතරට හා උඩරට නර්තන සම්ප්‍රදාය
ii. සබරගමු හා උඩරට නර්තන සම්ප්‍රදාය
iii. පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදාය
iv. සබරගමු හා පහතරට නර්තන සම්ප්‍රදාය
v. උඩරට හා සබරගමු නර්තන සම්ප්‍රදාය (...........)

09. "ඒ වේදේහ රජුගේ විධානයෙන් ආතත, විතත, විතතාතත, ඝන, සුසිර" යනාදි තූර්ය නාදයන් පිළිබඳ තොරතුරු ඇතුලත් වූ මෙම පාඨය දක්නට ලැබෙන්නේ,

i. කුරුණෑගල යුගයේ රචිත උම්මග්ග ජාතකය
ii. කෝට්ටේ යුගයේ රචිත ගුත්තිල කාව්‍යය
iii. කුරුණෑගල යුගයේ රචිත ථූපවංශය
iv. දඹදෙණි යුගයේ රචිත දඹදෙණි අස්නය
v. ගම්පල යුගයේ රචිත උම්මග්ග ජාතකය (...........)

10. "සිද්ධ මුනිඳු වැඩ හිඳ බෝ මුල විදුරාසන" .....යන කවි පදයේ,

i. සදැස්මත් 20, ලඝු මාත්‍රා 18, ගුරු මාත්‍රා 03
ii. සදැස්මත් 18, ලඝු මාත්‍රා 16, ගුරු මාත්‍රා 03
iii. සදැස්මත් 20, ලඝු මාත්‍රා 14, ගුරු මාත්‍රා 03
iv. සදැස්මත් 20, ලඝු මාත්‍රා 16, ගුරුමාත්‍රා 03
v. සදැස්මත් 18, ලඝු මාත්‍රා 12, ගුරු මාත්‍රා 04 (...........)

11. තාගෝර් තුමාගේ දායකත්වයෙන් ස්ථාපිත වූ විදේශීය නර්තන සම්ප්‍රදාය වනුයේ,

i. භාරත නර්තනය
ii. කතකලි නර්තනය
iii. කුච්චපුඩි නර්තනය
iv. කතක් නර්තනය
v. මනිපුරි නර්තනය (...........)

12. නර්තන විලාශ පිළිබඳ කෝකිල සංදේශයේ ඇතුලත් කවිය වනුයේ,

i. භරත සතර පෙර ඉසිවර කී ලෙසට
ii. අඳිමින් පට සළු ගෙල සඳුනෙත් තුනු තවරා
iii. ලෙලවන දිගු නෙත නිලුපුල සේයා
iv. විදෙන ලෙලෙන නරුබර පුළු ලුකුල රැඳී
v. රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා (...........)

13. නර්තනය විෂය අනිවාර්ය විෂයක් බවට පත් වර්ෂය හා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට
පත්වූ වර්ෂය වනුයේ,

i. 2005 - 1974
ii. 1974 – 2005
iii. 1972 – 2005
iv. 1956 – 1978
v. 1943 – 2005 (...........)

14. මන්ත්‍රී වන්නම සහ මහබෝ වන්නම යන නව වන්නම් රචනා කර ඇත්තේ,

i. ආරියරත්න කළුආරච්චි සහ මුදියන්සේ දිසානායක
ii. ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ සහ ජයසේන කෝට්ටේගොඩ
iii. ප්‍රේමකුමාර එපිටවල සහ ඩබ්ලිව් ඩී අමරදේව
iv. ඇස්. පණිභාරත සහ ශ්‍රියානි රාජපක්ෂ
v. ආරියරත්න කළුආරච්චි සහ ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ (...........)

15. සාම්ප්‍රදායික බලි රූපයක් වර්ණ ගැන්වීමේදී යොදා ගනු ලබන්නේ,

i. කිරිමැටි, තේ කොළ, ගස්වල පොතු
ii. ගස්වල පොතු, බුලත් විට, දැලි
iii. ශාක පත්‍ර යුෂ, දැලි, අඹරාගත් කහ
iv. ශාකපත්‍ර, පවුඩර්, දැලි
v. ගඩොල් කුඩු, පැන්කේක්, ශාක පත්‍ර යුෂ (...........)

16. පහතරට නර්තන සම්ප්‍රදායේ රංග වස්ත්‍රාභරණ කට්ටල වනුයේ,

i. තෙල්මෙ ඇඳුම, දෙවොල් ඇඳුම, නෙත්තිමාල ඇඳුම
ii. වෙස් ඇඳුම වඩිග පටුන ඇඳුම, පබළු ඇඳුම
iii. වෙස් ඇඳුම, දෙවොල් ඇඳුම, පබළු ඇඳුම
iv. දෙවොල් ඇඳුම, තෙල්මෙ ඇඳුම, වඩිග පටුන ඇඳුම
v. වඩිග පටුන ඇඳුම, නෙත්තිමාල ඇඳුම, වෙස් ඇඳුම (...........)

17. දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීතය හා බැඳි තාල ඇතුළත් වරණය තෝරන්න.

i. රූපක තාල, මධ්‍ය තාල, ත්‍රිපුට තාලය
ii. රූපක තාල, මධ්‍ය තාල, ජප් තාලය
iii. දෙ තාලය, අධ තාල, ජප් තාලය
iv. ඒක තාල, දෙ තාල, දාදරා තාලය
v. දාදරා තාලය, එක් තාලය, තුන් තාලය (...........)

18. ශාන්ති නිකේතනය, කලා ක්ෂේත්‍රය හා කේරළ කලා මණ්ඩපය යන ආයතන වල නිර්මාතෘ පිළිවෙලින් වන්නේ.

i. උදය ශංකර්, තාගෝර්, රුක්මණී දේවි අරුන්ඩේල්
ii. තාගෝර්, රුක්මණී දේවී අරුන්ඩේල් , වල්ලතෝල් නාරායන මෙනන්
iii. උයද ශංකර්, ශ්‍රීමතී මේනකා, බාලා සරස්වති
iv. රවින්ද්‍රනාත් තාගෝර්, වලිතොල් නාරායනයන් මෙතන්, රුක්මණී දේවි අරුන්ඩේල්
v. ශ්‍රී නේරු, උයද ශංකර්, බාලා සරස්වති (...........)

19. "රිම් ගත ගත ගදිත ගතම් ගත් දිත් තත් දොම්" යන පදය ආරම්භ වන ඉරට්ටිය අයත් වන්නේ,

i. ගෙජ්ජි මාත්‍රය
ii. සිංදු මාත්‍රය
iii. පට්ටුතාල් මාත්‍රය
iv. මුල් මාත්‍රය
v. ශුද්ධ මාත්‍රය (...........)

20. කොළදු පරිතාල් අරිච්චෙට්ටු සහ පින්නල් කෝලාට්ටම් යන ද්‍රවිඩ ගැමි නැටුම් වලට සමාන සිංහල ගැමි නැටුම් වනුයේ,

i. තේ දළු, ගොයම්, ලී මල්ලිය සහිත ලී කෙළි නැටුම
ii. තේ දළු, කලගෙඩි, කුළු
iii. කුලු, ලී කෙළි, ගොයම්
iv. තේ දළු, කලගෙඩි, ලී මල්ලිය සහිත ලී කෙළි නැටුම
v. ගොයම්, කුලුතේ දළු (...........)

21. ශාන්තිකර්මවල වෙස් මුහුණු පළඳා කරනු ලබන රංගනයේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ,

i. රංගනය කරනු ලබන චරිත වල චරිත ලක්ෂණ ඉස්මතු කිරීමට
ii. ප්‍රේක්ෂකයාට හාස්‍ය රසය ලබාදීමට
iii. ප්‍රේක්ෂකයාට රස ජනනය කරවීමට
iv. ශාන්තිකර්මයේ හාස්‍යය, භය ,ශෝක, රසයන් හඳුන්වාදීමට
v. ප්‍රේක්ෂකයන් බියට පත් කිරීමට (...........)

22. ප්‍රාසාංගික වේදිකාවක කණ්ඩායම් නර්තනයක් සකස් කිරීමේදී වඩාත් අවධානය යොමු කළ යුත්තේ,

i. ගායනය, වාදනය හා නර්තන අලංකාරයට ආලෝකය යොදා ගැනීම
ii. සහභාගී වන ශිල්පී / ශිල්පිනියන්ගේ රංග වස්ත්‍රාභරණ කෙරෙහි
iii. පුද්ගල අවකාශය අනුව පසුතල නිර්මාණය පිළිබඳ
iv. පුද්ගල පොදු අවකාශය අනුව රංග වින්‍යාසය සහ රංග වස්ත්‍ර පිළිබඳ
v. නර්තනයට නව සංගීත තාල යොදා ගන්නා ආකාරය අනුව (...........)

23. පොකුරු බෙරය, යක් බෙරය, බුම්මැඩිය යොදා ගනු ලබන්නේ,

i. තේවා වාදනයයේදීගැමි නැටුම් වලදී, යක් තොවිල් වලදී
ii. යක් තොවිල් වලදී, හේවිසි වාදන වලදී, ගොයම් නැටුමේදී
iii. හේවිසි වාදනයේදී, යක් තොවිල් වලදී, ගොයම් නැටුමේදී
iv. පෙරහර අවස්ථාවේදී, ගොයම් නැටුමේදී, උඩරට නැටුමේදී
v. උඩරට නැටුමේදී, පහතරට නැටුමේදී, සබරගමු නැටුමේදී (...........)

24. සන්නි යකුම හෙවත් දහ අට සන්නිය ශාන්තිකර්මය සඳහා පසුබිම් වී ඇති කතා පුවත් වනුයේ,

i. මැණික්පාල කතාව හා සංඛපාල කතාව
ii. දං උදියාගේ කතාව සහ මැණික්පාල කතාව
iii. රිද්දි බිසව් කතාව හා සංඛපාල කතාව
iv. දං උදියාගේ කතාව හා සංඛපාල කතාව
v. මංගල කුමරුගේ කතාව හා රිද්දි බිසව්ගේ කතාව (...........)

25. භාරත නාට්‍යම් සහ කථකලි නර්තනයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩ වනුයේ,

i. තබ්ලාව හා චෙන්ඩාව
ii. මෘදංගය හා මද්දලය
iii. තබ්ලාව හා මද්දලය
iv. කෝල් බෙරය හා මෘදංගය
v. මෘදංගය හා චෙන්ඩාව (...........)

- **ප්‍රශ්න අංක 26 සිට 35 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

26. උඩරට වෙස් බැඳීමේ මංගල්‍යයෙන් පසු ආධුනික ශිල්පියෙකු ප්‍රථම වරට නර්තනය කරනු ලබන්නේ.............................................නර්තනයයි.

27. කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධව තිබූ සෞන්දර්ය අධ්‍යන ආයතනය ස්වාධීන ව සෞන්දර්ය කලා විද්‍යාලය බවට පත් වූයේ...................................වර්ෂයේදීය.

28. සළු පාලිය, ගිරි දේවී, සුරඹා වල්ලිය යන නර්තන අංග නූතන වේදිකාවට ගැලපෙන අයුරින් හඳුන්වා දෙනු ලැබුවේ ..........................................................................ශිල්පියා විසිනි.

29. බැරිසිල් මුද්‍රා නාට්‍යයේ රංග වින්‍යාසය සැලසුම් කර ඇත්තේ................................................................. විසිනි.

30. සොළොස් මඟල, ගවරමල, සිව්ලිය යන විශේෂිත සැරසිලි ...........................................................ශාන්තිකර්මයේ විශේෂ තැනක් ගනී.

31. සාත්වික හා ආහාර්ය අභිනයන් අතරින් පොහොසත්ම නර්තන සම්ප්‍රදාය ලෙස, දක්ෂිණ භාරතයේ...................................... නර්තන සම්ප්‍රදාය හැඳින්විය හැකිය.

32. කාන්තාවන් වෙනුවෙන් පවත්වනු ලබන 'කුමාර සමයම නම් දාරකෝත්පත්ති' ශාන්තිකර්මය............................................ සම්ප්‍රදායේ දැකගත හැකිය.

33. තම්මැට්ටමේ "හඬබෑය හා මණ්ඩම" සම්බන්ධ කෙරෙන වරපට ගෙතුම............................................යන නාමයෙන් හඳුන්වයි.

34. සන්නියකුම ශාන්තිකර්මයේ තාණ්ඩව ගති ලක්ෂණ පාමින් පැමිණෙන..................................................රන් පැහැයෙනුත් වානරයෙකුගේ මුහුණට සමාන වෙස් මුහුණක් පලඳි.

35. "වලියක් මංගල්‍යය විමසුම"...........................................................................නම් කෘතිය විසින් රචනා කරන ලද ග්‍රන්ථයකි.

- **ප්‍රශ්න අංක 36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර තිත් ඉරිමත ලියන්න.**

36. ලක්දිව බෞද්ධ බලියාග ක්‍රමයක් ස්ථාපිත කිරීමට පුරෝගාමී වූ හිමිවරුන් දෙදෙනෙක් නම් කරන්න.

    1. ..................................................................................
    2. ..................................................................................

37. පතුරු නැටුම සහ මෝල්ගස් නැටුම සිංහල ප්‍රාසාංගික වේදිකාවට ගෙන එන ලද කලාකරුවන් නම් කරන්න.

    1. පතුරු නැටුම - ..................................................................................
    2. මෝල්ගස් නැටුම -..................................................................................

38. දාදරා සහ ජප් තාල් යන හින්දුස්ථානි තාල වලට සමාන දේශීය තාල හඳුන්වන පාරිභාෂික නාම ලියන්න.

    1. දාදරා -..................................................................................
    2. ජප් තාල් -..................................................................................

39. සබරගමු නර්තන සම්ප්‍රදායේ කිරි ගවයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් පවත්වනු ලබන සහ එම නර්තන සම්ප්‍රදායේම කාන්තාවන් වෙනුවෙන් පවත්වනු ලබන ශාන්තිකර්ම වෙනුයේ,

    1. කිරි ගවයන්ගේ ආරක්ෂාව -..................................................................................
    2. කාන්තාවන් වෙනුවෙන් -..................................................................................

40. පහත දැක්වෙන ඡායාරූපය අයත් ශාන්තිකර්ම හා නර්තනාංග නම් කරන්න.



1. ශාන්තිකර්ම -......................................................
2. නර්තනාංග -......................................................

41. සංස්කෘතික දෙපාර්තමේන්තුව ආරම්භ කළ වර්ෂය සහ ගිරාගම සෞන්දර්ය ගුරු විද්‍යාලය ආරම්භ කළ වර්ෂය ලියන්න.

1. සංස්කෘතික දෙපාර්තමේන්තුව -....................................
2. ගිරාගම සෞන්දර්ය ගුරු විදුහල -....................................

42. "කච්චකෙට්ට" සහ "තත්කාර්" අභ්‍යාස වලට මූලික වන නර්තන සම්ප්‍රදායන් නම් කරන්න.

1. කච්චකෙට්ට -......................................
2. තත්කාර් -......................................

43. පටාචාරා නම් වූ කලාකෘතිය ප්‍රථම වරට රඟ දක්වන ලද්දේ,

1. වර්ෂය -....................................
2. රඟහල -....................................

44. A B





ඉහත දැක්වෙන කෝලම් නාටකවල එන වෙස් මුහුණු නම් කරන්න.

1. A -.....................................
2. B -.....................................

45. "තිස් තුන්වන සින්දු වන්නම" රචනා කළ මහාචාර්යවරයා සහ එම වන්නම සඳහන් කරන්න.

1. මහාචාර්යවරයා -................................................
2. වන්නම -................................................

46. රුසියාවේ බැලේ නර්තන කලාවේ කේන්ද්‍රස්ථානය සහ එවකට සිටි අතිවිශිෂ්ට රංග රචකයා නම් කරන්න.

1. කලා කේන්ද්‍රස්ථානය -................................................
2. රංග රචකයා -................................................

47. ලොව ප්‍රථම ස්ථිරව ගොඩනගන ලද එළිමහන් කවාකාර රංග භූමිය කුමක්ද? එය පිහිටා ඇත්තේ කොහේද?

1. රංග භූමිය -................................................
2. ස්ථානය -................................................

48. "වඩිග පටුන සහ සූනියම් යක්ෂණී" රංගනය කරනු ලබන ශාන්තිකර්මය වනුයේ,

1. වඩිග පටුන -................................................
2. සූනියම් යක්ෂණී -................................................

49. ජීන් ජෝර්ජ් නෝර්වේ සහ මයිකල් ෆෝකින් යන දෙදෙනා බැලේ නර්තන කලාවට පිවිසෙන්නේ කුමන රටකින්ද?

1. ජීන් ජෝර්ජ් නෝර්වේ -................................................
2. මයිකල් -................................................

50. මහනුවර දළදා පෙරහැර සම්බන්ධයෙන් ඉටුකෙරෙන ප්‍රධාන චාරිත්‍ර විධි දෙක ලියන්න.

1. ආරම්භක චාරිත්‍රය -................................................
2. අවසාන දින චාරිත්‍රය -................................................

**

{ සියලු හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලු හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்தி ணைக்கலாம் - வடமத்திய மாகானம்
Department of Education – North Central Province

| 13 - ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | කාලය : පැය 03 විනාඩි 10 |
|---|---|---|

## නර්තනය (දේශීය) - II කොටස

52 S II

පාසලේ නම :- ..........................................................
විභාග අංකය :- ..........................................................

**උපදෙස් :**

- **මෙම ප්‍රශ්න පත්‍රය I , II හා III වශයෙන් කොටස් 3 කින් සමන්විතය.**
- **I කොටසේ ප්‍රශ්න 02 ම අනිවාර්ය වේ.**
- **II හා III කොටස් වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න දෙක ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතුය.**
- **සෑම ප්‍රශ්නයකම I කොටසට ලකුණු 06ක් ද, II කොටසට ලකුණු 06 ක් ද, III කොටසට ලකුණු 08ක් ද, වශයෙන් මුළු ලකුණු 20 බැගින් හිමි වේ.**

### I - කොටස

01)

i පහත සඳහන් බෙර පද අතරින් ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් බෙරපදය තෝරා ප්‍රස්ථාර කරන්න.

- දොංත තදොම් තදොම් රුදග ජිං තකට ගත කුදගත
- රෙගුද ගතකු දොම්
- ජිංකිටි තත් තත් කිටිතක

ii පහත සඳහන් කවි පදය මාත්‍රා (3+4) තාල රූපයට ප්‍රස්ථාර කරන්න.

"නිල්ලා රැළිලා අඳිනා සේලය
තුනු ඉඟ බබලව තෙයි"

iii මයුරා වන්නමේ අඩව්ව හෝ ලලිතරාග තාලයේ සින්දු වන්නමේ ඉරට්ටිය හෝ තිසරා වන්නමේ අඩව්ව ප්‍රස්ථාර කරන්න.

02) "දේශීය නර්තන කලාවේ ඓතිහාසික පසුබිම විවිධ යුගයන් ඔස්සේ විමසා බැලිය හැකිය."

i යාපහුව යුගයේ පුරාවිද්‍යාත්මක සාධක ඇසුරෙන් ඉහත කියමන සනාථ කරන්න.

ii නර්තන කලාවට රාජ්‍ය අනුග්‍රහය ලැබී ඇති ආකාරය සාධක තුනක් යටතේ පැහැදිලි කරන්න.

iii අධ්‍යාපනික වශයෙන් නර්තන කලාවේ ඇති වූ පුනරාගමනය 1970 දශකයෙන් පසු සිදු වූ සිදුවීම් ඇසුරෙන් විමසන්න.

### II - කොටස

03) "විවිධ සමාජ ඇදහිලි හා විශ්වාස පදනම් කරගත් දේශීය ශාන්තිකර්ම ඊට ආවේණික ලක්ෂණ ප්‍රදර්ශනය කරයි."

i රට යකුම හෙවත් රිද්දියාගය ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු ඇසුරෙන් පැහැදිලි කරන්න.

ii කිරිමඩු ශාන්තිකර්මයේ චාරිත්‍ර විධි දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

iii වලියක් මංගල්‍ය ශාන්තිකර්මය, කොහොඹාකංකාරිය ශාන්තිකර්මයෙන් වෙනස් වන්නේ කෙසේදැයි විග්‍රහ කරන්න.


Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

04) "මනෝචිකිත්සක වෛද්‍ය ක්‍රමයක් ලෙස ශාන්තිකර්ම පද්ධතිය හඳුන්වා දිය හැකිය."

i රටයකුම ශාන්තිකර්මය ඇසුරින් ඉහත කියමන සනාථ කරන්න

ii බලි ශාන්තිකර්මය තුළ අන්තර්ගත සුවිශේෂතා පිළිබඳ හැඳින්වීමක් කරන්න.

iii සන්නියකුම හෙවත් දහ අට සන්නිය ශාන්තිකර්මයේ භාවිත රංග භාණ්ඩ හා රංග වස්ත්‍රාභරණ වල සුවිශේෂතා පිළිබඳ හඳුන්වන්න.

05) "දේශීය ගැමි නැටුම් හා ගැමි නාටක මගින් දේශීය අනන්‍යතාවය මෙන්ම සංස්කෘතිය ද පිළිබිඹු කරන කලා අංගයන්ය."

i ගැමි නැටුම් තුළින් පිළිබිඹු වන ආගමික ඇදහිලි හා විශ්වාස පිළිබඳ විග්‍රහයක් කරන්න

ii සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් වල සමානතා හා අසමානතා සාකච්ඡා කරන්න

iii ජස ලෙන්චිනා කෝලම ඇසුරෙන් සමාජ සම්බන්ධතාවල ස්වරූපය හා සමාජයට ලබා දෙන්නා වූ පණිවිඩය පිළිබඳ සාකච්ඡා කරන්න.

**III- කොටස**

06)

| A | B | C |
|---|---|---|
| පච්චා | බැරිසිල් | හංසවිල |
| මෘදංගය | පටාචාරා | රවින්ද්‍රනාත් තාගෝර් |
| රාස්ලීලා | නල දමයන්ති | නවාබ් වලිජ් අලීෂා |
| සරානා හෙවත් ගුරුකුල | කරදිය | ද නම් ක්‍රැකර් |

i A කොටස - කථකලි නර්තන සම්ප්‍රදායට අයත් වේශ නිරූපණ ක්‍රමය තෝරාගෙන ඒ පිළිබඳ හඳුන්වන්න.

ii B කොටස - 2014 වර්ෂයේ නිෂ්පාදනය කළ දේශීය මුද්‍රා නාට්‍ය තෝරාගෙන එහි චරිත නිරූපණය පිළිබඳ විමසන්න.

iii C කොටස - මනිපුරි නර්තන සම්ප්‍රදායේ ප්‍රවර්ධනයට දායක වූ පුද්ගලයා තෝරා ඔහු පිළිබඳ හඳුන්වන්න.

07) "නූතන තාක්ෂණික මෙවලම් භාවිතය නිසා නර්තන කලාව වර්තමානයේ ජනප්‍රිය කලාවක් බවට පත්ව ඇත."

i වේශ නිරූපණය (අංගරචනය), රංග වස්ත්‍රාභරණ, ආලෝකකරණය ඇසුරෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

ii සාම්ප්‍රදායික රංග භූමිය හා නූතන රඟමඩල (වේදිකාව) ඇසුරින් නර්තන කලාව පිළිබඳ විමසන්න.

iii ජනමාධ්‍ය ඔස්සේ විකාශනය වන රියැලිටි වැඩසටහන්වල සාර්ථක අසාර්ථක භාවය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

08) "අද්‍යතන නර්තන කලා අංග විවිධාංගිකරණයේදී පෙරදිග හා අපරදිග ආභාෂය බෙහෙවින් ලබා ඇති බව ප්‍රදර්ශනය වේ."

i දේශීය නර්තන කලාවේ ප්‍රගමනයට බලපෑ නව ප්‍රවණතා විස්තර කරන්න.

ii නර්තන කලාවේ පෝෂණයට බලපෑ පෙරදිග හා අපරදිග ආභාෂය පිළිබඳ විග්‍රහ කරන්න.

iii අද්‍යතන ප්‍රාසාංගික නර්තනාංග සන්නිවේදනය කිරීමෙහිලා රූපවාහිනිය දක්වන සායකත්වය අගයන්න.

***

(8) WWW.PastPapers.WiKi (8)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න